# මිය ගිය අයකුට කස පහර දීම



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්
ප්‍රවීණ මාධ්‍යවේදී
ඇස්.පියසේන

**1960 දී සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ ප්‍රධානත්වයෙන් පත් වූ රජය කන්නංගර යෝජනා ක්‍රමයේ දෙවන පියවර වූ පාසල් රජයට පවරා ගැනීම ඉටු කළේ බලවත් විරෝධතාවන් මැදය. මෙහිදී එක්සත් ජාතික පක්ෂය යෝජනාවට විරුද්ධ විය.**

අද දේශපාලන වේදිකාවේ ප්‍රධාන මාතෘකාවක් වී ඇත්තේ නිදහස් අධ්‍යාපනය රැක ගැනීමයි. දවසකට ටියුෂන් පන්ති 4කට යන තුන්වන පන්තියේ දරුවෙක් දවසේ තුන්වැනි පන්තියට ගියේ සිය මව සමඟ ය. ඔවුහු බස් රථයෙන් යන විට තරුණ උද්ඝෝෂකයන්ගේ පෙළපාලියක් යනු දුටුහ. කුඩා දරුවා මවගෙන් මෙබඳු ප්‍රශ්නයක් ඇසුවේ ය.

"අම්මේ... මොකද්ද මේ නිදහස් අධ්‍යාපනය කියන්නේ ?" ඊට පිළිතුරු දුන් මව කීවේ

"ඒ තවත් ටියුෂන් පන්තියක් වෙන්ටඃ" කියා ය.

ඇත්ත වශයෙන් මේ රටේ නියම නිදහස් අධ්‍යාපනයක් තිබුණේ ද ?

අප දන්නා ඉතිහාසය අනුව නම් දෙවන ලෝක යුද්ධය අවසන් වී මාස කිහිපයක් ගත යූ පසු (1946) රාජ්‍ය මන්ත්‍රණ සභා ඇමති මණ්ඩලයේ ඇමතිවරුන් 7 දෙනෙකුගෙන් තුන් දෙනෙකුගේ විරෝධය මැද 'කන්නංගර යෝජනාව' සම්මත වූ බව සැබෑ ය.

නිදහස් අධ්‍යාපන යෝජනා ක්‍රමයේ ප්‍රධාන පරමාර්ථය වූයේ එවකට පාසල් ගාස්තු ගෙවන සිසු දරු දැරියන්ට පමණක් සීමා වූ ඉංග්‍රීසි අධ්‍යාපනය ඇතුළු විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා සෑම රටවැසියෙකුට ම තමන්ගේ දරුවන්ට රැහැන් මගින් නොමිලේ අධ්‍යාපනයක් ලබා දීමයි. ඊට අමතරව එදා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ තිබූ මැතිවරණ කොට්ඨාස 50න් මධ්‍ය මහා විද්‍යාල 50ක් පිහිටුවීමට ද යෝජනා කරන ලදී.

පනත අනුව රජයේ ආධාර ලබන පාසල් බහුතරය නිදහස් අධ්‍යාපන ක්‍රමයට එකතු වූ නමුදු ඇතැම් "කුල්ටූර්" (මහජාතියෙන්) පිම්බුණු විද්‍යාල කිහිපයක් රජයේ අධාර නොලබා පාසල් ගාස්තු උඩ තම ආයතන පවත්වා ගැනීමට පියවර ගත්හ.

ගල්කිස්සේ ශාන්ත තෝමස්, කොළඹ බිෂොප් හා මහනුවර ට්‍රිනිටි යනාදී විද්‍යාල මේ අතර කැපී පෙනුණේ ය.

1947 පළමු පාර්ලිමේන්තු මැතිවරණයේ දී නිදහස් අධ්‍යාපනයේ පියා වූ සී.ඩබ්.ඩබ්. කන්නංගර මහතා පරාජයට පත් වී ය. බොහෝ දෙනා බලාපොරොත්තු වුයේ නිදහස් අධ්‍යාපන යෝජනා ක්‍රමයේ 'අගසව්වෙක්' මෙන් පෙනී සිටි ඒ. රත්නායන මහතාට අධ්‍යාපනය කැබිනට් ඇමති පදවිය ලැබේය යන්න ය. එහෙත් ඒ මහතාට ලැබුණේ ආහාර හා සමූපකාර අමාත්‍යයයි. අධ්‍යාපන අමාත්‍ය පදවිය ලැබුණේ කන්නංගර යෝජනා ක්‍රමයට පක්ෂපාතී නොවූ ඊ. ඒ. නුගවෙල මහතාට ය.

අධ්‍යාපන ඇමති ඊ.ඒ. නුගවෙල මහතා අධ්‍යාපන අධ්‍යක්ෂ පදවියට එංගලන්තයෙන් විශේෂඥයෙක් ගෙන්වූයේය. ඔහුගේ නම ආචාර්ය 'හෝවි' ය. යටත් විජිත යුගයේ අවසාන කාලයේදී පවා ලාංකිකයන් දැරූ මේ පදවියට නිදහසින් පසු එංගලන්තයෙන් අධ්‍යක්ෂවරයෙකු ආනයනය කළේ ඇයි ද ? යන්න බොහෝ දෙනාගේ විමතියට හේතු වී ය.

මොරටුව මන්ත්‍රී සෝමවීර චන්ද්‍රසිරි මහතා පැවසුවේ "නිදහස් අධ්‍යාපන කරත්තය ඉදිරියට යෑම වළක්වා 'හෝවි' කියමින් තිතක් තැබීමට නව අධ්‍යාපන ඇමතිවරයාට අවශ්‍ය නිසා ඔහු 'හෝවි' ආනයනය කළ බවය.

ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු තේරී පත් වූ මන්ත්‍රීවරුන් 95 දෙනා පිළිබඳව දිවංගත කපිල සෙනෙවිරත්න කිවියා පොතක් පළ කළේ ය.

ඒ. රත්නායක මහතාගේ රත්නායක මහතාගේ රත්නායක මහතාගේ රත්නායක මහතාගේ පිටුවේ පළවූ කවි දෙපදයක් මෙසේය.
"නොසිතූ විලෂ කිසිවෙකු මේ සිහල බිමේ
වෙනසක් සිදු වුණා නියමිත ඇමති කමේ "

කෙසේ හෝ වේවා නිදහස් අධ්‍යාපනය එදා පටන් ගමන් කළේ ඉබි ගමනේය.

1952 දෙවන පාර්ලිමේන්තු මැතිවරණයේ දී කන්නංගර මහතා පාර්ලිමේන්තුවට තේරී පත් වී ය. එහෙත් ජනතාව මවිතයට පත් කරමින් ඒ මහතාට පවරන ලද්දේ අධ්‍යාපන අමාත්‍යංශය නොව පළාත් පාලන අමාත්‍යංශයයි.

මේ සියල්ල සිදු වූයේ නිදහස් අධ්‍යපන ක්‍රමයට විරුද්ධ න්‍යාය පත්‍රයකට අනුකූලව බව ජනතාව තේරුම් ගත්හ.

1956 යුග පෙරළියෙන් පසුව ද අධ්‍යාපන ඇමති පදවියට පත් ඩබ්. දහනායක මහතා නිදහස් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කළේ 'දියාරු' වැඩ පිළිවෙලකි.

සියලු පාසල් රජයට පවරා ගැනීමේ කන්නංගර යෝජනා ක්‍රමයට ඔහු තරයේ ම විරුද්ධ වී ය.

1960 දී සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ ප්‍රධානත්වයෙන් පත් වූ රජය කන්නංගර යෝජනා ක්‍රමයේ දෙවන පියවර වූ පාසල් රජයට පවරා ගැනීම ඉටු කළේ බලවත් විරෝධතාවන් මැදය. මෙහිදී එක්සත් ජාතික පක්ෂය යෝජනාවට විරුද්ධ වී ය. එහෙත් එම පක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙක් යෝජනාවට පක්ෂව ඡන්දය දුන්හ.



**පිටරට විශ්වවිද්‍යාලවලට ඉගෙනුම ලබන සම්පූර්ණ ශ්‍රී ලාංකික ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සංගණනයක් කළහොත් හ් සංඛ්‍යාව මෙරට විශ්වවිද්‍යාලවල (බාහිර උපාධිය හැර) ඉගෙනුම ලබන නිත්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වඩා වැඩිවන්නටද ඉඩ තිබේ.**

එදා පර්ලිමේනතුවේ සිටි ප්‍රවීනම අධ්‍යාපනඥයා වූ පී. ද ඇස් කුලරත්න මහ.ා හින්දය ප්‍රකාශ කරලේ පක්ෂයෙන්ද ඉවත් වෙමිනි.

හෝමාගම මන්ත්‍රී ගාමිණී ජයසූරිය මහතා යෝජනාවට පක්ෂව ඡන්දය දීමට තමාට අවසර දෙන ලෙස පක්ෂයෙන් ඉල්ලා සිටියේ "මේ යෝජන-ාව තම මුත්තනුවන් වූ අනගාරික ධර්මපාල තුමාගේ ප්‍රතිපත්තිවලට අනුකූල වන බව කියමිනි.

නිදහස ලැබූ දා පටන් දිගින් දිගටම ඉබිගමනට සීමා වූ නිදහස් අධ්‍යාපනයට කණකොකා හැඬුවේ 1977 උදා වූ විවෘත ආර්ථිකයත් සමඟ ය.

"සල්ලි වියදං කොරන්ඩ පුළුවන් දෙමාපියන්ට තමුංගේ ළමයින්ට සල්ලි ගෙනලා ඉගෙන ගන්න උඹමනායි නං ඒ පහසුකොම කියන්ට උඹමනයි."

යන ප්‍රතිපත්තිය උඩ නගරයක් නගරයක් පාසා පාසල් ගාස්තු අයකරන, ඉංග්‍රීසි මාධ්‍ය පාසල් බිහිවන්නට වී ය. ඒ වා අතර ඉන්ටර්නැෂනල් හෙවත් (මහජාතියේ) 'ජාත්‍යන්තර පාසල්' සෑම නගරයකම පිහිටුවන ලදී.

විනිමය නීති ලිහිල් කිරීමත් සමඟ කාසි පනම් ඇති මව්පියෝ ලංකාවේ විශ්වවිද්‍යාලවලට වරම් නොලද තම දරුවන් පිටරට විශ්වවිද්‍යාලවලට යවන්නට පටන් ගත්හ. 1976 දී දිල්ලි විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලැබුයේ ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් 6 දෙනෙකු පමණකි. අද එය දහස දක්වා වැඩි වී තිබේ. මේ අතර පකිස්ථානය හා බංගලාදේශය පමණක් නොව නේපාලයේ පවා විශ්වවිද්‍යාලවලට ශ්‍රී ලාංකික සුසන් යන්නේ බුරුතු පිටිනි.

යාබද රටවල විශ්වවිද්‍යාල මධ්‍යම පන්තියේ ශ්‍රී ලාංකික උපාධි අපේක්ෂකයන්ගෙන් පිරෙන අතර ධනවත් මව්පියන් තෝර් ගෙන ඇත්තේ එක්සත් ජනපදය, කැනඩාව, ඕස්ට්‍රේලියාව හා නවසීලන්තය යන රටවල් ය.

ශ්‍රී ලංකාවේ අසරණ ස්ත්‍රීන් මැදපෙරදිග දුක් කම්කටොලු විඳිමින් උපයන වටිනා විදේශ විනිමය වැය කරන පිටරට විශ්වවිද්‍යාලවලට ඉගෙනුම ලබන සම්පූර්ණ ශ්‍රී ලාංකික ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සංගණනයක් කළහොත් හ් සංඛ්‍යාව මෙරට විශ්වවිද්‍යාලවල (බාහිර උපාධිය හැර) ඉගෙනුම ලබන නිත්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වඩා වැඩිවන්නටද ඉඩ තිබේ.

ඒ විශ්වවිද්‍යාල ගැනය.

බාලාංශයේ පටන් උසස්පෙළ දක්වා සිසු පරපුර අද "ටියුෂන් සහ වෑන්" අධ්‍යාපනයට හැඩ ගැසී සිටිති. මේ අධ්‍යාපනය විසම චක්‍රයකි.

අපේ අධ්‍යාපන ක්‍රමය යටතේ විශ්වවිද්‍යාලවලට ඇතුළු වීමට අවසර නොලැබෙව සිසුන්ට වෘත්තීය අධ්‍යාපනය සඳහා පසුගිය අවුරුදු 50 තුළ යොදා ඇති ක්‍රමවේද මොනවාදැයි පෙනෙන්නට නැත. එසේ වුවද රත්මලානේ පිහිටුවන ලද පරමානු කාර්මික ආයතනයේ ඉගෙනුම අවසන් කොට සහතික පත්‍රය ලබා අද ඕස්ට්‍රේලියාවේ පමණක් සේවය කරන ශ්‍රී ලාංකික පිරිස දහසකට වැඩිය.

එහෙත් වෙනත් වෘත්තීන් සඳහා පසුගිය අවුරුදු 50 ඇතුළත පුහුණුකර ඇති සංඛ්‍යාව ඉතා අල්පය. මේ යාථාර්තයන් වටහා නොගෙන 'නිදහස් අධ්‍යාපනය රැකගමු' කියමින් මහ හඬින් බෙරිහන් දීම මිය ගිය අයෙකුට කසයෙන් තලන්නාක් මෙන් නොවේ ද ?

From Page 4

glowing example.

China has become a strong supporter of Sri Lanka and helped it to suppress the 30-year old struggle with the terrorists in many ways. The ruthless civil war devastated the economy of the country and the unity that prevailed among the major races.

Sri Lanka's ties with China are as old as the country's history. Roman historian and naturalist Pliny's reference to Sri Lankan links with China had been made as early as the fourth century and the visit of the Chinese Buddhist monk Fa-hien (5th century A.D.) to Sri Lanka to acquire Buddhist scriptures are eloquent testimony to the age-old links with China.

Modern day ties started with the Rubber-Rice pact signed in 1952 between the two countries that provided a large market for Sri Lanka's rubber and Sri Lanka was also able to get rice produced in China at a lower price.

In 2007, President Mahinda Rajapaksa visited China to celebrate the 50 years of diplomatic ties with China and signed an Agreement of Cultural Cooperation.

Sri Lanka granted China an exclusive economic zone on the lines of SEZ to attract more investment from China. The Hong-Kong based Chinese company; Huichen Investment Holdings Ltd will invest $28 million to develop the zone located in Mirigama.

Since 2006, the Chinese government has provided Sri Lanka $3.04 billion in financial assistance for the freeway connecting Katunayaka airport to Colombo, railway extension from Matara to Kataragama, Norochcholai Coal Power Plant, Hambantota Port Development Project and a Building Centre for the Performing Arts in Colombo.

China has now become Sri Lanka's largest aid donor replacing the traditional donors from Europe and the West.




සන්නස

මංගල යෝජනා
දැන්වීම්
ප්‍රතිඵලදායකයි